ජාතික විද්‍යා පදනම - පාසල් විද්‍යා සමාජ වැඩසටහන



# පාසල් විද්‍යා සමාජයන්හි විශිෂ්ටත්වය ඇගැයීම සඳහා නිර්ණායක (Guidelines for Star Ratings)

## *ඔබ විද්‍යා සමාජයට විශිෂ්ටත්වය සඳහා වූ තරු ලකුණු ලබාගන්නේ කෙසේද?*

- ඔබ පාසලේ විද්‍යා විෂය ධාරාවන් හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෙන්ම අනිකුත් විෂයධාරාවන් හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ද සම්බන්ධ කර ගනිමින් විද්‍යා විෂය පාසල තුළ ජනප්‍රිය කරවීම සඳහා ‘පාසල් විද්‍යා දිනයක්’ සාර්ථක ලෙස සංවිධානය කිරීම.

  මෙම විද්‍යා දින වැඩසටහනේ පහත සඳහන් අංග ඇතුළත් විය යුතුය.

  1. විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධ දේශන/ඉදිරිපත් කිරීම් (මේ සඳහා සම්පත් දායකයින් ලෙස විද්‍යාඥයින් හා විශ්වවිද්‍යාල ආචාර්යවරුනගේ සේවය ලබාදීමට ජාතික විද්‍යා පදනමට කටයුතු කළ හැකිය).
  2. විද්‍යාව ජනප්‍රිය කරවීම සඳහා නාට්‍ය නිෂ්පාදනය කර රඟ දැක්වීම.
  3. විද්‍යාව සම්බන්ධ මාතෘකාවන් ඔස්සේ පැවැත්වෙන ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් සහ විවාද තරඟාවලීන් සංවිධානය කිරීම.

- නොවැම්බර් 10 දිනට යෙදෙන ලෝක විද්‍යා දිනය සැමරීම සඳහා ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කරනු ලබන විවිධ ක්‍රියාකාරකම් සහ තරඟාවලීන් සඳහා ක්‍රියාකාරී ලෙස සහභාගී වීම. (මීට අදාළ අන්තර් විද්‍යා සමාජ තරඟාවලීන් පිළිබඳ විස්තර යථා කාලයේදී ඔබ වෙත දන්වා එවීමට කටයුතු කරනු ලැබේ).

- ජාතික විද්‍යා පදනම සහ අනිකුත් ආයතන මගින් සංවිධානය කරනු ලබන වැඩමුළු/සම්මන්ත්‍රණ/වැඩසටහන්/ක්ෂේත්‍ර චාරිකා සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.

- ඔබ ප්‍රදේශයේ ඇති ගැටලු (සෞඛ්‍ය, පාරිසරික, කෘෂිකාර්මික, තාක්ෂණික, අපද්‍රව්‍ය කළමනාකරණය ආදී ක්ෂේත්‍ර) හඳුනා ගැනීම, ඒවා විසඳීම සඳහා සුදුසු ව්‍යාපෘති/වැඩසටහන් යෝජනා කිරීම හා සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම. (මේ සඳහා සුදුසු ව්‍යාපෘති යෝජනා ජාතික විද්‍යා පදනම සඳහා ඉදිරිපත් කළ හැකි

අතර එහිදී සුදුසු යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කරනු ලැබේ).

- පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නිර්මාණශීලී කුසලතා වැඩිදියුණු කිරීම සහ නව නිර්මාණ බිහිකිරීමට දිරිමත් කිරීම සඳහා ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ ජාතික විද්‍යා පදනම මගින් පවත්වනු ලබන තරුණ විද්‍යාඥයින් සඳහා වූ ජාතික සම්මානය සඳහා සුදුසු නව නිපැයුම් ඉදිරිපත් කිරීම. (මේ සඳහා අයදුම් කළ යුතු අකාරය පිළිබඳ වැඩි විස්තර පසුව දන්වනු ලැබේ).

- විද්‍යා හා තාක්ෂණයට අදාළ නව සොයාගැනීම්, නව නිර්මාණ ආදියෙහි විස්තර ඇතුලත් බිත්ති පුවත්පතක් පවත්වාගෙන යෑම/වාර්ෂිකව හෝ අර්ධ වාර්ෂිකව පුවත් සඟරාවක් ප්‍රකාශට පත් කිරීම.

- ඔබ ප්‍රදේශයේ අනෙකුත් විද්‍යා සමාජ හා සහයෝගයෙන් වැඩමුළු, සම්මන්ත්‍රණ, ව්‍යාපෘති ආදී විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.

විද්‍යා සමාජය වාර්ෂිකව සිදුකරන ලද මෙම ක්‍රියාකාරකම්/වැඩසටහන් පිළිබඳ සවිස්තර වාර්තාවක් අදාළ ඡායාරූප සහ තහවුරු කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් ලියකියවිලිද සමග පාසලේ විදුහල්පතිතුමා හරහා එවීමට කටයුතු කළ යුතුය. ඔබ විද්‍යා සමාජයට තරු සම්මාන පිරිනැමීම සඳහා මෙම වාර්තාවෙහි ඇති කරුණුද උපයෝගී කරගනු ලැබේ. **මෙම වාර්ෂික වාර්තාව සෑම වසරකම පෙබරවාරි 15 දිනට ප්‍රථම අප වෙත එවීමට කටයුතු කළ යුතුවේ.** එසේම මේ සමග ඉදිරි වර්ෂය සඳහා ඔබ විද්‍යා සමාජය සැලසුම් කර ඇති වැඩසටහන් වල විස්තරයන්ද එවිය යුතුවේ.

තරු වැඩි ප්‍රමාණයක් ලබා ගන්නා විද්‍යා සමාජ ලෝක විද්‍යා දින පාසල් වැඩසටහනේදී සම්මානයට පාත්‍ර වනු ඇත. තවද එම විද්‍යා සමාජ භාර ගුරු මහත්ම මහත්මීන්ද විශේෂ පිළිගැනීමකට ලක්කිරීමටද ජාතික විද්‍යා පදනම කටයුතු කිරීමට තීරණය කර ඇත.